## ගම්පහ ප්‍රාදේශීය සභාව
## ගම්පහ දිස්ත්‍රික්කය

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 22 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ඔක්තෝබර් 26 දින සභාපතිවරයාට යවා ඇත.

1.2 **තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ගම්පහ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

1.3.1 **ගිණුම්කරණ ප්‍රතිපත්ති**

ස්ථාවර වත්කම් ගිණුම් තැබීමට අදාලව ගිණුම්කරණ ප්‍රතිපත්තියක් හඳුනාගෙන නොතිබුණි. ස්ථාවර වත්කමක් ලෙස ගිණුම්ගත කළයුතු අවම වටිනාකම, වත්කමේ ආයු කාලය හා නැවත විකුණා මුදල් කර ගැනීමේ හැකියාව යන කරුණු සැලකිල්ලට නොගෙන ස්ථාවර වත්කම් ගිණුම්ගතකර තිබුණි.

1.3.2 **ගිණුම්කරණ අඩුපාඩු**

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) මුදල් අමාත්‍යාංශය නමින් හිමිකම් ලියවිලි සහිත රු.ලක්ෂ 04 ක් වටිනා ට්‍රැක්ටරයක් හා ටේලරයක් මෝටර් වාහන හා කරත්ත ගිණුමට ඇතුලත්කර තිබුණි.

(ආ) බදු දී ඇති කඩ කාමර සඳහා සභාව විසින් ගෙවන ලද විදුලි බිල්පත් වටිනාකම රු.189,719 ක් කඩහිමියන්ගෙන් ප්‍රතිපූරණය කර ගැනීම සඳහා වූ ණයගැති ගිණුමට රු.18,344 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඇ) සභාවේ ආදායමක් ලෙස ගිණුම්ගතකර තිබූ සේවකයින් 22 කට ගෙවිය යුතු සේවක අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ රු.1,133,005 ක් සඳහා ණයහිමි ප්‍රතිපාදන ඇතිකර නොතිබුණි.

1.3.3 **නොසැසඳුණු ගිණුම්**

ගිණුම් විෂයන් 07 ක මූල්‍ය ප්‍රකාශන අනුව දක්වා ඇති ශේෂ හා උපයෝගී ලේඛන හා වාර්තා අනුව ශේෂයන් අතර එකතුව රු.18,118,514 ක වෙනස්කම් නිරීක්ෂණය විය.

1.3.4 **ලැබිය යුතු හා ගෙවියයුතු ගිණුම්**

**ලැබිය යුතු ගිණුම්**

(අ) සභාව විසින් කඩ කාමර 10 ක් වෙනුවෙන් 2016 ජනවාරි සිට 2017 ජූනි/ජූලි කාල පරිච්ඡේදවල විදුලිය සඳහා ගෙවූ රු.103,634 ක ගාස්තුව සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් කඩ හිමියන්ගෙන් අයකර නොතිබුණි.

(ආ) 2014 වර්ෂයේ ව්‍යාපෘති 22 කට අදාලව ලැබිය යුතු රු.මිලියන 2.2 ක් හා 2015 වර්ෂයේ ව්‍යාපෘති 08 කට අදාලව ලැබිය යුතු රු.මිලියන 1.1 ක් විය.

(ඇ) ලැබිය යුතු රු.1,614,551 ක භාණ්ඩ හා සේවා බදු මුදල 2007 වර්ෂයේ සිට 2018 ජූලි 31 දින දක්වා අයකරගැනීමට කටයුතුකර නොතිබුණි.

1.3.5 **විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

**තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම**

වටිනාකම රු.227,984,373 ක්වූ ගිණුම් විෂයයන් 06 කට අදාල සාක්ෂි ඉදිරිපත් නොකිරීම නිසා ඒවා විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

1.3.6 **නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) 1971 අංක 48 දරන පළාත් පාලන ආයතන පිළිබඳ විශේෂ විධිවිධාන පනත | වර්ෂ 05 කට වරක් කළ යුතු වරිපනම් බදු තක්සේරුව 2002 වර්ෂයෙන් පසු කර නොතිබුණි. |
| (ආ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | |
| (i) 180 හා 181 රීති | සභාවේ ලේකම්, ආයුර්වේද වෛද්‍යවරු ඇතුළු තවත් නිලධාරීන් 05 දෙනෙක් ඇප තැබීමට ක්‍රියාකර නොතිබුණි. |
| (ii) 193 රීතිය | එක් එක් ආදායම් විෂයය යටතේ වන අතිරික්ත හා ඌනතාවයන් සහ එක් එක් වැය විෂයය යටතේ වන අතිරික්ත හෝ ඉතිරිකිරීම් පිළිබඳ කරුණු පැහැදිලි කරන ප්‍රකාශයක් සෑම වර්ෂයකම දෙසැම්බර් 31 දිනට පිලියෙළ කර විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඇ) බදු ගිවිසුම් වල කොන්දේසි අංක 18 | බදු ගැනුම්කරු විසින් බදුගත් දේපළ බදු දීමනාකරුගේ ලිඛිත අවසරයක් නොමැතිව වෙනත් අයෙකුට විකිණීම, පැවරීම, උකස් කිරීම, බදු දීම හෝ වෙනත් කිසිවකු හවුල් කරගෙන ව්‍යාපාර පවත්වාගෙන යාම තහනම් වුවද කඩකාමර වැඩි ප්‍රමාණයක් බදුකරුවන් විසින් අතුරුබදු දී තිබුණි. |

2. **මූල්‍ය සමාලෝචනය**

2.1 **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.66,591,252 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.57,253,966 ක් විය.

2.2 **ආදායම් පරිපාලනය**

2.2.1 **ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්**

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත්කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2017 වර්ෂය ඇස්තමේන්තු ගත ආදායම | 2017 වර්ෂය බිල්කළ ආදායම | 2017 වර්ෂය රැස්කළ ආදායම | 2017 වර්ෂය දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2016 වර්ෂය ඇස්තමේන්තු ගත ආදායම | 2016 වර්ෂය බිල්කළ ආදායම | 2016 වර්ෂය රැස්කළ ආදායම | 2016 වර්ෂය දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 18,543,690 | 18,399,205 | 19,627,496 | 35,364,629 | 23,750,000 | 19,581,197 | 19,287,095 | 36,949,463 |
| කුලී | 10,335,518 | 8,204,817 | 9,737,221 | 3,694,348 | 7,530,000 | 8,565,990 | 10,695,576 | 4,522,038 |
| බලපත්‍ර ගාස්තු | 1,284,475 | 525,550 | 1,031,573 | - | 1,752,500 | 270,500 | 1,359,961 | 1,255,958 |
| වෙනත් ආදායම් | 16,685,000 | - | 8,854,423 | - | 20,454,802 | - | 8,901,281 | - |

2.2.2 **ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

පූර්ව වර්ෂයේ රැස්කළ ආදායම රු. මිලියන 40.2 ට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ රැස්කළ ආදායම රු. මිලියන 39.2 දක්වා රු. මිලියනයකින් අඩුවී තිබුණි. මේ සඳහා කුලී ආදායම රු.958,355 කින් අඩුවීම හා බලපත්‍ර ගාස්තු රු.328,388 කින් අඩුවීම හේතුවී තිබුණි.

2.2.3 **වරිපනම් හා බදු**

(අ) වරිපනම් ඒකක 52,471 කින් වරිපනම් අයකිරීම 2002 වර්ෂයේ දේපළ තක්සේරුව මත සිදුකර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වරිපනම් ඒකක 34,892 කින් සමන්විත හිඟ වරිපනම් ශේෂය වූ රු. මිලියන 35.36 තුල වසර 01 සිට 05 දක්වා රු. මිලියන 8.9 ක්, වසර 05 සිට 10 දක්වා රු.මිලියන 6.9 ක් හා වසර 10 ට වැඩි රු.මිලියන 19.4 ක් ඇතුලත් විය.

2.2.4 **කඩකුලී**

(අ) වැලිවේරිය සතිපොළ බදු දීමේ බදු ගිවිසුම අනුව සතිපොළ විදුලිය සඳහා විදුලි බිල්පත් මාසිකව බදුකරු විසින් ගෙවිය යුතු වුවද, 2016 හා 2017 වර්ෂවල රු.132,182 ක් වූ විදුලි බිල්පත් සභාව විසින් ගෙවා තිබුණි.

(ආ) සතිපොළ භූමියේ දිනකට වාහන විශාල ප්‍රමාණයක් නවතා තිබෙන නමුත් සභාව සතු රථ ගාලක් ලෙස සංවර්ධනය කර ආදායම් ලබාගෙන නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට වැලිවේරිය පොදු වෙළඳපොල කඩකාමර 05 කින් රු.462,420 ක් හා මාළු කඩයකින් රු. 64,000 ක් ද, ගලහිටියාව උප කාර්යාලයට අයත් කඩයකින් රු.1,408,000 ක් හා ගම්පහ කඩකාමර 12 කින් රු.521,802 ක් හිඟව තිබුණි.

2.2.5 **වෙනත් ආදායම්**

(අ) **පරිසර බලපත්‍ර**

(i) බල ප්‍රදේශයේ පිහිටි පරිසර බලපත්‍ර ලබාගත යුතු ආයතන 15 ක් බලපත්‍ර ලබා ගෙන නොතිබුණි.

(ii) වලංගු කාලය වර්ෂ 03 ඉක්මවූ ව්‍යාපාර ආයතන 06 කින් බලපත්‍රය අළුත්කිරීමේ ඉල්ලීම් ඉදිරිපත්කර නොතිබුණි.

(iii) බල ප්‍රදේශයේ පවතින පරිසර බලපත්‍ර ලබාගත යුතු ආයතන පිළිබඳව 2017 වර්ෂය මුලදී සමීක්ෂණයක් සිදුකර නොතිබුණි.

(ආ) **දැන්වීම් පුවරු ආදායම්**

(i) 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 122 හා 126 වගන්ති හා 2015 දෙසැම්බර් 28 දිනැති අංක 1947/6 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පල කරන ලද 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ 01 වන උපලේඛනයේ අයකළ යුතු ගාස්තු ප්‍රකාරව සහා බලසීමාවට අයත් ප්‍රදේශයේ ඇති සියළුම දැන්වීම් පුවරුවලින් ගාස්තු අයකළයුතු වුවද, ප්‍රචාරණ දැන්වීම් 24 කින් හා බැනර් 08 කින් ගාස්තු අයකර නොතිබුණි.

(ii) ගලහිටියාව උප කාර්යාලයේ ප්‍රචාරණ දැන්වීම් ලේඛනයක් පවත්වා නොතිබුණි.

(ඇ) **සම්ප්‍රේෂණ කුළුණු ආදායම**

(i) විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අනුමත ලැයිස්තුව අනුව ස්ථාපිත කර ඇති සහා බල ප්‍රදේශයට අයත් දුරකථන කුළුණු සියල්ල හඳුනාගෙන 2009 අප්‍රේල් 17 දිනැති අංක 1597/8 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ V වන උපලේඛනයේ V වන වගන්තිය ප්‍රකාරව ආදායම එකතු කර ගත යුතු වුවත්, ගම්පහ උප කාර්යාල බල ප්‍රදේශයේ 26 ක් වූ සියළුම කුළුණු වලින් ගාස්තු අයකර නොතිබුණි.

(ii) ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දුරකථන කුළුණු වල සවිකරන ලද තරංග හුවමාරු උපකරණ අයත් ආයතනවලින් ආදායම් ලබාගැනීමට පියවර ගෙන නොතිබුණි.

2.2.6 **මුද්දර ගාස්තු හා උසාවි දඩ**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු. මිලියන 10 ක් හා මුද්දර ගාස්තු රු.මිලියන 77.4 ක් විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) **අතුරු ව්‍යවස්ථා**

ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 17 ක් ඉටුකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2017 දෙසැම්බර් 31 දින වන විටත් කාරණා 15 ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි.

(ආ) **ක්‍රියාකාරී සැලැස්ම**

පනවා තිබූ අතුරු ව්‍යවස්ථා අනුව සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙලකර තිබුණත් 2017 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් වූ ක්‍රියාකාරකම් 01 ක් ක්‍රියාත්මක කිරීමට අපොහොසත්වී තිබුණි. කාලානුරූපීව කාර්යසාධන ප්‍රගතිය හා මූල්‍ය ප්‍රගතිය පරීක්ෂා කළහැකි පරිදි ක්‍රියාකාරී සැලැස්මට අනුරූපව ප්‍රගති වාර්තා සකස්කර නොතිබුණි.

(ඇ) **අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම.**
වැලිවේරිය පොදු වෙළඳපොළ බිම් මහලේ කඩ කාමර 06 ක් 2014 වර්ෂයේ සිටද, කඩ කාමර 03 ක් 2016 වර්ෂයේ සිටද, ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ලේ කඩ කාමර 02 ක් 2009/2010 වර්ෂවල සිටද, කඩ කාමර 02 ක් 2012 වර්ෂයේ සිට ද අපේක්ෂිත ප්‍රතිලාභ රහිතව තිබුණි.

(ඈ) **ක්‍රියාත්මක නොකල කර්තව්‍යන්**
සමාලෝචිත වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට යෝජිත කර්තව්‍යයන් 12 ක් 2017 දෙසැම්බර් 31 වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඉ) **ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**
සභා බලප්‍රදේශය තුල කසළ අපහරණය වෙනුවෙන් ප්‍රාග්ධන වැය රු.389,838 ක් හා අයභාර වැය රු.මිලියන 26.3 ක් විය. මසකට ජනනය වන කසළ ප්‍රමාණය ටොන් 320 ක් පමණ දඹුවවත්ත පෞද්ගලික ඉඩමකට බැහැරකර බිම් කුලිය ලෙස වර්ෂයට රු.5,987,700 ක් ඉඩම හිමිකරු වෙත ගෙවා තිබුණි. එහෙත් මෙම කසළ බැහැරකරන ස්ථානයට පරිසර බලපත්‍රයක් ලබාගෙන නොතිබුණි.

(ඊ) **තිරසර සංවර්ධන ඉලක්ක**
තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව ප්‍රාදේශීය සභාව දැනුවත්ව නොසිටීම හේතුවෙන් එම අරමුණු සඳහා වන ගෝලීය දර්ශක තුලින් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් 2018 අගෝස්තු 14 දින වන විටත් සකස්කර නොතිබුණි.

3.2 **කළමනාකරණ අකාර්යක්ෂමතා**

(අ) රු.2000 සිට 4000 දක්වා කුලියකට බදු දී තිබූ පොදු වෙළඳපොළේ කඩ කාමර හතරක් බදු ගිවිසුමේ කොන්දේසි වලට පටහැනිව රු.6,000 සිට 15,000 දක්වා මාසික කුලියකට අතුරුබදු දී තිබුණි.

(ආ) හිඟ වරිපනම් ගෙවිය යුතු පුද්ගලයින්ට විස්තර සහිතව රතු නිවේදනයක් මගින් පූර්ව දැනුම්දීමක් සිදු නොකර දේපළ තහනම් කිරීමේ නියෝග නිකුත්කර තිබූ අතර 2011 වසරේ සිට භාවිතයට නොගත් රතු නිවේදන පත්‍රිකා 19,000 ක් ගබඩාවේ තිබුණි.

(ඇ) 2017 වර්ෂයට වෙළඳ ආයතන සඳහා බලපත්‍ර ලබාදීමට අදාල අයදුම්පත් මහජන සෞඛ්‍ය පරීක්ෂක කාර්යාලය වෙත යොමුකර තිබූ නමුත් අනුමත වී ආපසු ලැබීමේ ප්‍රමාදයක් විය.

(ඈ) 2016 වර්ෂයේ ජනවාරි 01 සිට ජුලි 13 දක්වා පානීය ජලය ලබා ගැනීම සඳහා පාර පළුදු කිරීම හා පාර අළුත්වැඩියා කිරීම වෙනුවෙන් ලබාගෙන තිබූ තැන්පතු මුදල් රු.101,230 ක් අදාල කාර්යය සඳහා යොදාගෙන නොතිබුණි.

3.3 **මානව සම්පත් කළමනාකරණය**

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අනුමත හා තථ්‍ය කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත පරිදි විය.

| ශ්‍රේණිය | අනුමත | තථ්‍ය | පුරප්පාඩු | අතිරික්ත |
|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 01 | 02 | - | 01 |
| තෘතීයික | 01 | 01 | - | - |
| ද්වීතීයික | 53 | 52 | 01 | - |
| ප්‍රාථමික | 118 | 105 | 13 | - |

| | | | | |
|---|---|---|---|---|
| 25/2014 චක්‍රලේඛය අනුව | 09 | 09 | - | - |
| | ------ | ----- | ---- | ----- |
| | 182 | 169 | 14 | 01 |
| | === | === | === | ==== |

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලයේ විදුලි කාර්මික තනතුරක්, පුස්තකාල සහායක තනතුරක්, කාර්යාල කාර්ය සහායක තනතුරු 03 ක්, වැඩ/ ක්ෂේත්‍ර කම්කරු තනතුරු 04 ක්, සෞඛ්‍ය කම්කරු තනතුරක් හා රියදුරු තනතුරු 02 ක් පුරප්පාඩු වී තිබුණි.

(ඇ) සේවය හැරගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.141,600 ක් අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

(ඈ) 2017 නොවැම්බර් 10 දින සිට වර්ෂයක් සඳහා තාක්ෂණ නිලධාරිනියක් පාර්ලිමේන්තුවේ සේවය සඳහා තාවකාලිකව නිදහස්කර තිබුණි.

(ඉ) සේවක ඇප තැන්පත් කළයුතු නිලධාරීන් 06 දෙනෙකු ඇප තැන්පත්කර නොතිබුණි.

(ඊ) සේවකණය ගිණුමේ නිලධාරීන් 05 දෙනෙකුගේ සේවක ණය ශේෂ රු.263,368 ක් වැඩියෙන් හා නිලධාරීන් තිදෙනෙකුගේ සේවක ණය ශේෂ රු.10,000 ක් අඩුවෙන් සටහන්කර තිබුණි.

3.4 <u>වත්කම් කළමනාකරණය</u>

3.4.1 <u>වත්කම් ලේඛනගත නොකිරීම</u>

රු. මිලියන 146.6 ක් වටිනා ඉඩම් හා ගොඩනැගිලි, රු. මිලියන 3.9 ක් වටිනා යන්ත්‍ර හා උපකරණ, රු. මිලියන 3.9 ක් වටිනා මෝටර් රථ හා කරත්ත ස්ථාවර වත්කම් ලේඛනවල ඇතුලත් කර නොතිබුණි.

3.4.2 <u>නඩත්තු හා අළුත්වැඩියා නොකිරීම.</u>

ට්‍රැක්ටරයක් හා ටේලරයක් වාහන අංගනය තුල දිරාපත්වෙමින් දීර්ඝ කාලයක සිට තිබෙන නමුත් එම වාහන සුදුසු පරිදි අළුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

3.4.3 <u>පවරා නොගත් වත්කම්</u>

දේපළෙහි අයිතිය නිරවුල් කරගෙන ඔප්පු සකස්කර නොමැති ඉඩම් ප්‍රමාණය 18 ක් විය.

3.4.4 <u>නිශ්ක්‍රීය/ඌන උපයෝජිත වත්කම්</u>

(අ) ඉඹුල්ගොඩ පුස්තකාලයේ ඉතා හොඳ තත්ත්වයෙන් ඇති සෙන්ට්‍රික් වතුර පොම්පය නිශ්ක්‍රියව තිබුණි.

(ආ) පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයෙන් 2014 නොවැම්බර් 17 දින ලබා දී තිබූ රු.434,175 ක් වටිනා අඟල් 1 ¼ GI පයිප්ප 448 ක ප්‍රමාණයක් නිෂ්ක්‍රියව තිබුණි.

3.4.5 <u>වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය</u>

(අ) ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 203 පරිදි සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි, මෝටර් රථ හා කරත්ත, යන්ත්‍රෝපකරණ ඇතුළු ස්ථාවර වත්කම් සමීක්ෂණය කර නොතිබුණි.

(ආ) 2017 පුස්තකාල සමීක්ෂණ වාර්තා අනුව පුස්තකාල 05 කට අයත් රු.64,807 ක් වටිනා පොත් 461 ක් අස්ථානගතවී තිබුණි.

(ඇ) බැහැර දී ආපසු නොදුන් රු.7,449 ක් වටිනා පොත් 36 ක් සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

3.5 **ප්‍රසම්පාදනය**

3.5.1 **වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

2006 ජනවාරි 25 දිනැති ජාතික ප්‍රසම්පාදන ඒජන්සි චක්‍රලේඛ අංක 8 හි 4.2.1 (බී) සහ (සී) පරිදි ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම හා වාර්ෂික විස්තරාත්මක සැලැස්ම පිළියෙලකර නොතිබුණි.

3.5.2 **කොන්ත්‍රාත් පරිපාලනය**

රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2012 හා 2012 ජනවාරි 05 දිනැති චක්‍රලේඛයේ 3.3 වගන්තිය ප්‍රකාරව කොන්ත්‍රාත්තුව පිරිනමන අවස්ථාවේ අදාල ප්‍රජාපාදක සංවිධානය කොන්ත්‍රාත් 03 කට වැඩි කොන්ත්‍රාත් ප්‍රමාණයක නිරත වී නොසිටියයුතු වුවද, 2017 අගෝස්තු 01 දින ඇඹිල්ලයාය ගොවි සංවිධානය සමඟ රු.ලක්ෂ 14 ක් වටිනා කොන්ත්‍රාත් 04 ක ගිවිසුම් එකම දිනකදී අත්සන්කර තිබුණි.

4. **යහපාලනය හා ගිණුම් කටයුතු භාවය**

**අයවැය පාලනය**

2017 වර්ෂයේ අයවැය ලේඛනයෙන් මුදල් ප්‍රතිපාදන වෙන් කරගෙන තිබුණු අපේක්ෂිත කාර්යයන් සිදුකර නොතිබීම හෝ අවශ්‍ය නොවීම නිසා වැය විෂයන් 21 කට අදාල ඇස්තමේන්තුගත මුළු ප්‍රතිපාදනය රු.මිලියන 9.09 ක් ඉතිරිව තිබුණි. ඒ අනුව අපේක්ෂිත සැලසුම් නිවැරදිව හඳුනාගෙන අයවැය පිළියෙලකර නොතිබුණි.

5. **පද්ධති හා පාලනය**

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතුය.

.

| | පද්ධතිය | | අඩුපාඩුව |
|---|---|---|---|
| (අ) | ආදායම් පරිපාලනය | (i) | යාවත්කාලීනව දේපළ තක්සේරු නොකිරීම. |
| | | (ii) | හිඟ ආදායම් එකතුකිරීමට කටයුතු නොකිරීම. |
| | | (iii) | නව ආදායම් ප්‍රභවයන් හඳුනා නොගැනීම. |
| (ආ) | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය | (i) | කසළ එකතු කිරීම හා බැහැර කිරීම පිළිබඳව ජනතාව දැනුවත් නොකිරීම. |
| | | (ii) | කසළ බදු අය නොකිරීම. |
| (ඇ) | වත්කම් කළමනාකරණය | (i) | හිමිකම් ඔප්පු ලබා නොගැනීම. |
| | | (ii) | වත්කම් පිළිබඳ ලේඛන පවත්වා නොගැනීම. |
| | | (iii) | පිරිවැය නොමැති ස්ථාවර වත්කම්වල වටිනාකම තක්සේරුකර ගිණුම්ගත නොකිරීම. |
| | | (iv) | ස්ථාවර වත්කම් සමීක්ෂණය නොකිරීම. |
| (ඇ) | අයවැය පාලනය | (i) | ඇස්තමේන්තුගත මූල්‍ය ප්‍රතිපාදන භාවිතා නොකිරීම. |
| | | (ii) | අධි වෙන්කිරීම් තිබීම. |